**දේශගුණය අවම කිරීමේ ක්‍රියාකාරී සහයක ව්‍යාපෘතිය - 2021 අප්‍රේල් 30 දිනෙන් අවසන් මාස 04 සඳහා**

-----------------------------------------------------------------------------------------------------------------------------------

දේශගුණිය අවම කිරීමේ ක්‍රියාකාරී සහයක ව්‍යාපෘතියේ 2021 අප්‍රේල් 30 දිනෙන් අවසන් මාස 04 සඳහා සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිගොඩනැගීම් සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව අතර 2019 අප්‍රේල් 11 දින එළඹි අංක ටීඑෆ්0බී0017 දරන ප්‍රදාන ගිවිසුමෙහි II (අ) වන කොටසේ II වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ප්‍රදාන ගිවිසුම අනුව, පරිසර අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික දේශගුණික වෙනස්වීමේ ප්‍රතිපත්ති, උපායමාර්ග සහ ක්‍රියාමාර්ග සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමට ලබන්නන්ගේ ධාරිතාව සහ පද්ධති ශක්තිමත් කිරීම හෝ වෙළඳ හා වෙළඳපොළ නොවන අවමකිරීමේ උපකරණ නිර්මාණය කිරීම හෝ ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු වියදම ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 1.8කට සමාන රුපියල් මිලියන 315ක් වන අතර මුළු මුදලම මූල්‍යයනය කිරීමට ප්‍රතිගොඩනැගීම් සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව එකඟවිණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 අප්‍රේල් 11 දින ආරම්භ කරන ලද අතර 2021 පෙබරවාරි 28 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 අප්‍රේල් 30 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 04 ක කාල සීමාව සඳහා වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. ඌන උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජනවාරි 01 සිට 2021 අප්‍රේල් 30 දක්වා මාස 04ක කාලසීමාව සඳහා ලෝක බැංකුව විසින් රුපියල් මිලියන 118ක මුදලක් නිදහස් කර තිබුණු අතර, රුපියල් මිලියන 09ක් ලෝක බැංකුව වෙත ප්‍රතිප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව ඉහත කාලසීමාව සඳහා ලෝක බැංකුව විසින් සපයන ලද අරමුදලින් සියයට 7.8ක් සැළසුම්ගත ක්‍රියාකාරකම් සඳහා යොදවා නොතිබුණු බව නිරීක්ෂණ විය. | නියාමන, වාර්තාකරණ හා තහවුරු කිරීම පද්ධතිය සහ ශ්‍රී ලංකා කාබන් ලේඛනය සඳහා ආංශික පදනමින් පුහුණුව ලබාදීම, යෙදවීම, පාරිභෝගිකරණය, නියමුකරණය සහ නඩත්තුව සඟඳහා උපදේශන සේවා සහ දේශගුණික විපර්යාස වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රසම්පාදනය විවිධ හේතු නිසාවෙන් පිරිනමා නොතිබුණි. | කාල රාමුව තුළදී සැළසුම් කළ ක්‍රියාකාරකම් සඳහා අරමුදල් උපයෝජනය කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රුපියල් මිලියන 12.4ක් වටිනා පරිගණක 55ක් විගණිත දිනය වන විට අපේක්ෂිත අරමුණ සඳහා උපයෝජනය කර නොතිබුණි. | විභව සම්බන්ධිත පාර්ශව අතර බෙදාහරින ලද පරිගණක 55 මූලික සූදානම් කිරීමේ කටයුතු සඳහා යොදා ගනිමින් පවතින අතර, ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආයතනයේ ජාතික දේශගුණික විපර්යාස දත්ත හුවමාරු ජාලය යෙදවීමත් සමඟ ඒවා සම්පර්ණයෙන්ම උපයෝජනය වෙමින් පවතී. | අපේක්ෂිත අරමුණ සඳහා පරිගණක යොදා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |